ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

<u>ගීතා මහෝත්සවය 2025 කොළඹ දී සැමරේ</u>

කොළඹ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද ගීතා මහෝත්සවය මහත් භක්තියකින් සහ කලා අංගයන්ගෙන් සුසැදිව දෙසැම්බර් 09 වන දින සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ පණිභාරත රඟහලේ දී පැවැත්විණ.

2. ශ්‍රී ලංකාවේ නියෝජ්‍ය ඉන්දීය මහ කොමසාරිස් වෛද්‍ය සත්‍යාංජල් පාණ්ඩේ මැතිතුමා සහ විශ්ව විද්‍යාලයේ උප කුලපති මහාචාර්ය රෝහාන් නතේසිංහ මහා විසින් සංස්කෘතික උළෙල සමාරම්භ කරන ලදි.

3. ආචාර්ය රවිබන්දු විද්‍යාපති මහතා ප්‍රමුඛ රවිබන්දු සමන්ති නර්තන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද උඩරට නර්තනයකින් උළෙල ආරම්භ වූ අතර ඔවුන්ගේ නර්තනය ශ්‍රේෂ්ඨ මහා භාරතය ඇසුරින් සැකසුණු නර්තන විලාසයන් සමඟින් සාම්ප්‍රදායින උඩරට නර්තන රිද්මයන් අභිමානය සහ තදෙවත්භාවය වේදිකාව මතට රැගෙන ආවේය.

4. ඉන් අනතුරුව කලාශූරි ශ්‍රීමති වාසුගි ජගේදීශ්වරන් මහත්මියගේ මඟ පෙන්වීමට යටතේ නාට්‍ය කලා මන්දිරයේ සිසු සිසුවියන් විසින් නිර්තියංජලි, වර්ණම්, ගීත උපදේසම් සහ තිල්ලානා ඇතුළත් සංගීතමය ඉදිරිපත් කිරීමක් සිදු කළ අතර එය භරත නාට්‍යම්හි ආධ්‍යාත්මික සහ සෞන්දර්යාත්මක ගැඹුර පිළිබිඹු කළේය.

5. මඩකලපුව, නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ සිසු සිසුවියන් විසින් 'යාධව මාධව' නමින් ඉදිරිපත් කළ නර්තනාංගය මගින් රිද්මයානුකූල චලනයන්ගෙන්, විශිෂ්ට හැඟීම් ප්‍රකාශනයන්ගෙන් සහ සාම්ප්‍රදායික නර්තනයෙන් ක්‍රිෂ්ණා දෙවිඳුන්ගේ දිව්‍යමය ලීලාවන්, ප්‍රඥාව සහ තේජස කලාත්මකව ගෙන හැර දැක්විය.

6. භගවත් ගීතාවේ සදාකාලික අගයෙන් යුත් ඉගැන්වීම් වන යුතුකම, ධාර්මිකත්වය, එකමුතුභාවය සහ ආධ්‍යාත්මික පිබිදීම යන වටිනාකම් පිළිබිඹු කරමින් සහ ඉන්දියාවේ පොහොසත් සාම්ප්‍රදායික කලා උරුමය සමරමින් පැවති මෙම උළෙල සැමගේ නොමඳ ප්‍රශංසාවට ලක් විය. මෙම වැඩසටහන සංස්කෘතික හුවමාරුව සහ කලා විශිෂ්ටත්වය සඳහා අර්ථාන්විත සාක්ෂියක් විය.

***

**කොළඹ**
***2025 දෙසැම්බර් 10***